**එල්.ඩී.-ඕ. 8/2007**

**2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනත**

2007 අංක 35 දරන සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනතේ 36 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඈ) සහ (ඉ) ඡේද සමඟ කියවිය යුතු 67 වන වගන්තිය යටතේ විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා

2009, මස වැනි දින
කොළඹ දී ය.

**නියෝග**

1. මෙම නියෝග, 2009 උපකරණවල බලශක්ති කාර්ය සාධන ප්‍රමිතී (සුසංහිත ප්‍රතිදීප්ත පහන්) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. කිසිම තැනැත්තකු විසින්, මෙහි 1 වන උපලේඛනයේ II වන තීරුවේ නිශ්චිතව දක්වා ඇති බලශක්ති අනුප්‍රමාණවලට අනුරූපී වන එම උපලේඛනයේ I වන තීරුවේ දක්වා ඇති අවම කාර්ය සාධන ශ්‍රේණිගත කිරීම් හා අනුකූල නොවන්නාවූ සුසංහිත ප්‍රතිදීප්ත පහන්, ශ්‍රී ලංකාවට ආනයනය කිරීම හෝ ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කිරීම නොකළ යුතු ය.

3. 1 වන උපලේඛනයේ I වන තීරුවේ දක්වා ඇති අවම කාර්ය සාධන ශ්‍රේණිගත කිරීම් හා අනුකූල වන බවට වග බලාගැනීමේ කාර්ය, අවස්ථාවෝචිත පරිදි, සුසංහිත ප්‍රතිදීප්ත පහන් ආනයනකරුවකු හෝ නිෂ්පාදකවරයකුගෙන්, ආනයනය කරන ලද හෝ නිෂ්පාදනය කරන ලද සුසංහිත ප්‍රතිදීප්ත පහන්, එම අවම කාර්ය සාධන ශ්‍රේණිගත කිරීම් හා අනුකූල වන බව සහතික කරමින්, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිකුත් කරන ලද සහතිකයක් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටීමේ බලය අධිකාරිය සතුවේ. එසේ ඉදිරිපත් කරනු ලබන සහතිකයක් සාක්ෂි වශයෙන් ආවේශ්‍ය කරනු ලැබිය යුතු අතර, එහි ඇතුළත් කාරණා සම්බන්ධයෙන් එය බැලූ බැල්මට පෙනෙන සාධකයක් ද වන්නේ ය.

4. 2 වන නියෝගයෙහි නිශ්චිතව දක්වා ඇති අවශ්‍යතාවන් හා අනුකූල වන්නාවූ යම් සුසංහිත ප්‍රතිදීප්ත පහන් ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන හෝ ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කරනු ලබන සියලුම තැනැත්තන් විසින්, මෙම නියෝගයන්හි I වන උපලේඛනයේ II වන තීරුවේ නිශ්චිතව සඳහන් අදාළ බලශක්ති අනුප්‍රමාණ නිරූපණය කරන්නාවූ සහ මෙම නියෝගයන්හි 2 වන උපලේඛනයේ දක්වා ඇති ආකෘතිය, මිණුම් සහ ප්‍රමාණයන්ට අනුකූල වන්නාවූ බලශක්ති ලේබලයක්, නිෂ්පාදනය අසුරා ඇති කවරය, දවටනය හෝ පෙට්ටියෙහි අලවා තැබීමට සලස්වනු ලැබිය යුතු ය. එසේ නිරූපිත බලශක්ති අනුප්‍රමාණ, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් එම නිරූපිත අනුප්‍රමාණවල නිරවද්‍යතාව සහතික කරමින් නිකුත් කරන ලද සහතිකයක් මඟින්, සත්‍යායනය කරනු ලැබිය යුතු ය.

5. (අ) මෙම නියෝගවල 4 වන නියෝගය මඟින් පනවා ඇති නියමයන්ට අනුකූල නොවන්නා වූ; හෝ

(ආ) එම විශේෂ සුසංහිත ප්‍රතිදීප්ත පහන් සඳහා නිශ්චිතව දක්වා ඇති අවම කාර්ය සාධන ශ්‍රේණිගත කිරීම් හා අනුරූපී වන්නා වූ අනුප්‍රමාණයන් දරනු නොලබන්නා වූ හෝ පෙන්නුම් නොකරනු ලබන්නාවූ,

යම් බලශක්ති ලේබලයක්, එය ආවරණය කළ කවරයට හෝ දවටා ඇති දවටනයට හෝ බහාලු පෙට්ටියට හෝ සවි කොට ඇති, ශ්‍රී ලංකාවට ආනයනනයනය කරනු ලබන හෝ ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කරනු ලබන කිසිම සුසංහිත ප්‍රතිදීප්ත පහනක්, ගබඩා කිරීම, ප්‍රදර්ශනය කිරීම, තොග වශයෙන් හෝ සිල්ලර වශයෙන් විකිණීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ බෙදා හැරීම, කිසිදු තැනැත්තකු විසින් නොකළ යුතු ය.

6. පනතේ විධිවිධාන ප්‍රකාරව 2 වන, 4 වන හෝ 5 වන නියෝග මඟින් පනවා ඇති අවශ්‍යතාවන් පිළිපැදීමට අසමත්වූ තැනැත්තකු වරදකට වරදකරු කරනු ලැබූ විටක දී, එම වරද සඳහා පනවා ඇති දඬුවමට අමතරව, එම වරද සිදුකරනු ලැබුවේ යම් සුසංහිත ප්‍රතිදීප්ත පහන් සම්බන්ධයෙන් ද, එම සුසංහිත ප්‍රතිදීප්ත පහන් ඉවත් කිරීම හෝ විනාශ කිරීම සඳහා සහ එසේ ඉවත් කිරීම හෝ විනාශ කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය සම්බන්ධයෙන් නියෝගයක් කරන මෙන් අධිකරණයෙන් ඉල්ලා සිටීමට අධිකාරියට බලයක් ඇත. තවද, එසේ ඉවත් කිරීම හෝ විනාශ කිරීම සඳහා වැය වන වියදම එම වරදකරු විසින් දැරිය යුතු බවට එම අධිකරණ නියෝගය මඟින් සලස්වන ලෙස ඉල්ලා සිටීමේ හැකියාවද, අධිකාරිය සතු වේ.

7. මෙම නියෝගයන්හි :-

"පනත" යන්නෙන් 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනත අදහස් වේ ;

"අධිකාරිය " යන්නෙන් 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනතේහි 2 වන වගන්තිය මඟින් පිහිටුවන ලද ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය අදහස් වේ; සහ

"ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය" යන්නෙන් 1984 අංක 6 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පනත මඟින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය අදහස් වේ.

**1 වන උපලේඛනය** (2 වන නියෝගය)


බලශක්ති අනුප්‍රමාණවලට අනුරූපීවන අවම කාර්ය සාධන ශ්‍රේණිගත කිරීම්

| I වන තීරුව | II වන තීරුව |
|---|---|
| කාර්ය සාධන ශ්‍රේණිය (කා.ශ්‍රේ.)<br>(කාර්ය සාධන ශ්‍රේණිය ගණනය කිරීම සඳහා යොදාගත් සමීකරණය<br>කා.ශ්‍රේ = දීප්ත ක්ෂමතාව x 0.9 + ජව සාධකය x 100 x0.1 + වර්ණ ගැලපුම් සංගුණකය) | බලශක්ති අනුප්‍රමාණ<br>(තරුවලින් නිරූපිතය) |
| කා.ශ්‍රේ. > 70 | තරු පහයි xxxxx |
| 65< කා.ශ්‍රේ.≤70 | තරු හතරයි xxxx |
| 58< කා.ශ්‍රේ. ≤ 65 | තරු තුනයි xxx |
| 54< කා.ශ්‍රේ. ≤ 58 | තරු දෙකයි xx |
| 50≤ කා.ශ්‍රේ. ≤ 54 | තරු එකයි x |

**2 වන උපලේඛනය** (4 වන නියෝගය)

බලශක්ති ලේබලයන්හි ආකෘතිය, මිණුම් සහ ප්‍රමාණයන්


1 වැනි රූපය: විවිධ ප්‍රමිත සඳහා බලශක්ති ලේබල්




ඉහත ලේබලයේ උඩ වක්‍රව ඇති ප්‍රදේශයේ නිල් පැහැති පසුබිමේ කහ පැහැති තරුවලින් බලශක්ති ප්‍රමිත ඉදිරිපත් කර ඇත. එම අගය ලේබලය මැද අංකයනය කර ඇත. පහත දැක්වෙන විස්තර ඒ වෙනුවෙන් සපයා ඇති ඉඩ තුළ අනිවාර්යයෙන්ම මුද්‍රණය කළ යුතු ය.

- සැබෑ විදුලි පරිභෝජනය (වොට් ඒකකවලින්)
- සැබෑ විදුලි පරිභෝජනය මත පදනම් වූ මාසික විදුලි පරිභෝජනය
- මාදිලි අංකය
- වෙළඳ නාමය

2 වැනි රූපය: බලශක්ති ලේබලයේ සැබෑ පරිමානය




3 වැනි රූපය: ලේබලයේ මිණුම් සහ අකුරුවල ප්‍රමාණයන්




All Dimensions in Millimetres